වාණිජ ධාරා

වාණිජ විෂයය ගුරුසිසු අත්වැල

(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)

ගිණුම්කරණය - 33

නිපුණතාව 15

පිරිවැය හැසිරීම හා පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය

අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ

සම්පත් දායකත්වය : චරිත සේරසිංහ මයා

ර/ වලගම්බා මහා විද්‍යාලය

අප්සරා අමරසිංහ මිය

ර/ උඩගම මහා විද්‍යාලය

වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය

අන්තර්ගතය

15.0 පිරිවැය හැසිරීම හා පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය තුළින් කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක වෙයි. (කාලච්ඡේද 20)

නිපුණතාවතා මට්ටම්	විෂය අනතර්ගතය	ඉගෙනුම් ඵල

15.1 පිරිවැය හැසිරීම විග්‍රහ කරයි.	• හැසිරීම මත පිරිවැය වර්ග කිරීම
	    • ස්ථාවර පිරිවැය
	    • විචල්‍ය පිරිවැය
		• පිරිවැය හැසිරවීම මත වර්ග කරයි.
		• විචල්‍ය පිරිවැය පැහැදිලි කරයි.
		• ස්ථාවර පිරිවැය පැහැදිලි කරයි.
		• පිරිවැය හැසිරීම රේඛීය ශ්‍රිතයන් තුළින් පෙන්වයි.

15.2 පිරිවැය - පරිමා ලාභ විශ්ලේෂණය යොදාගෙන තීරණ ගැනීමට දායක වෙයි	• ඒකකයක දායකය
	• මුළු දායකය
	• දායක විකුණුම් අනුපාතය (ලාභ පරිමා අනුපාතය)
	• සමච්ඡේදන ලක්ෂ්‍ය
	• ආරක්ෂිත ආන්තිකය
	• සංවේදිතා විශ්ලේෂණය
	    • විකුණුම් මිල වෙනස්වීම
	    • විකුණුම් පරිමාව වෙනස්වීම
		• ඒකක දායකය ගණනය කරයි.
		• මුළු දායකය ගණනය කරයි.
		• දායක විකුණුම් අනුපාතය ගණනය කර තීරණ ගනියි.
		• සමච්ඡේදන ලක්ෂ්‍ය ඒකක ප්‍රමාණය හා වටිනාකම ගණනය කරයි.
		• ආරක්ෂණ ආන්තිකය ගණනය කරයි.
		• පිරිවැය - පරිමා ලාභ විශ්ලේෂණය සමීකරණ ප්‍රවේශයෙන් හා ප්‍රස්තාරික ප්‍රවේශයෙන් ඉදිරිපත් කරයි.
		• පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය මත තීරණ ගනියි.
		• විකුණුම් මිල හා විකුණුම් පරිමාව වෙනස්වන විට සංවේදීතාව දක්වන අයිතම පෙන්වයි.

(1) ආනන්ද විද්‍යාලයේ වාණිජ දිනය සැමරීම සඳහා ප්‍රධාන ශාලාව 500ක් දෙනෙකුගේ උපරිම ධාරිතාවෙන් ප්‍රයෝජනයට ගත හැකි ය. මේ සඳහා පහත වියදම් භාණ්ඩාගාරික විසින් ඇස්තමේන්තු කර තිබේ.

- එක් සිසුවකුට ලිපි ගොනු සඳහා රු.15/
- එක් සිසුවකුට තේ පැන් සඳහා රු.50/
- ආලෝකකරණය සඳහා රු.30,000/
- ශබ්දවාහිනී කටයුතු සඳහා රු.20,000/

ඉහත විස්තර අනුව

(1) ශිෂ්‍ය සංඛ්‍යාව අනුව වෙනස් වන පිරිවැය හඳුනාගන්න.
(2) ශිෂ්‍ය සංඛ්‍යාව අනුව වෙනස් නොවන පිරිවැය හඳුනාගන්න.

පිරිවැය හැසිරීම Cost Behavior

කිසියම් ප්‍රමාණාත්මක වෙනස්වීමක් අනුව (නිමවුම, කාලය, ඒකක, පරිමාව) පිරිවැය වෙනස්වීම

පිරිවැය හැසිරීම ලෙස හැඳින්වේ.

තීරණ ගැනීම සඳහා පිරිවැය වර්ග කිරිම

ස්ථාවර පිරිවැය ඃඍසංා ජදිඑ*

ගිණුම් කාලච්ඡේදයක් තුළ දී දරණ ලද පිරිවැයක් ක්‍රියාකාරී මට්ටම වෙනස්වීමක් සමඟ වෙනස් නොවන්නේ නම් එවැනි පිරිවැය ස්ථාවර පිරිවැය වේ.

නිදසුන්: යන්ත්‍ර ක්ෂය, කම්හල් කුලී, යන්ත්‍ර රක්ෂණය

ප්‍රමාණය	ස්ථාවර පිරිවැය
0	100 000
100	100 000
200	100 000
300	100 000
400	100 000
500	100 000

විචල්‍ය පිරිවැය (Variable cost)

ක්‍රියාකාරී මට්ටමට නැතහොත් නිෂ්පාදන හෝ විකුණුම් පරිමාවට අනුව සෘජු අනුපාතයකින් වෙනස්වන පිරිවැය විචල්‍ය පිරිවැය වේ.

නිදසුන්: අමුද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය, වෙනත් සෘජු පිරිවැය, නිෂ්පාදනය මත පුරස්කාරය

ප්‍රමාණය	මුළු විචල්‍ය පිරිවැය
0	0
100	10 000
200	20 000

300	30 000
400	40 000
500	50 000

(2) පාසලක වාණිජ සංගමය විසින් සංවිධානය කරන ලද අධ්‍යාපන චාරිකාවකට අදාළව පහත සඳහන් තොරතුරු එක්රැස් කර ඇත. (රු.)

- මගීන් 50 කට අසුන් ගත හැකි බසයක ප්‍රවාහන කුලිය — 20 000
- සම්පූර්ණ චාරිකාව සංවිධානය කිරීමේ වියදම — 4 000
- එක් ශිෂ්‍යයකුගේ ආහාර වියදම — 300
- ස්ථාන නැරඹීම සඳහා එක් ශිෂ්‍යයකුගේ ප්‍රවේශ පත්‍ර ගාස්තු — 100
- එක් ශිෂ්‍යයකුගෙන් අය කළ යුතු ගාස්තුව — 1 000
- චාරිකාවට සහභාගී වේ යයි අපේක්ෂිත ළමුන් ගනන — 50

අවශ්‍ය වන්නේ :

1) චාරිකාවෙහි අපේක්ෂිත මුළු ස්ථාවර පිරිවැය
2) චාරිකාවෙහි එක් ළමයකු වෙනුවෙන් අපේක්ෂිත විචල්‍ය පිරිවැය
3) චාරිකාවෙහි ළමුන් 50ක් සහභාගී වේ නම් අපේක්ෂිත මුළු විචල්‍ය පිරිවැය
4) චාරිකාවෙහි ළමුන් 50ක් සහභාගී වේ නම් අපේක්ෂිත මුළු පිරිවැය හා මුළු ආදායම
5) ඇති නොවීමට චාරිකාවට සහභාගී විය යුතු අවම සිසුන් සංඛ්‍යාව අතර වෙනස.
6) පහත වගුව පුරවන්න.

ළමුන් ගනන	ස්ථාවර පිරිවැය	විචල්‍ය පිරිවැය	මුළු පිරිවැය	මුළු ආදායම	අතිරික්තය හෝ ඌනතාවය.
0					
10					
20					
30					
40					
50					

ආන්තික පිරිවැයකරණය **(Marginal Costing)**

විචල්‍ය පිරිවැය පමණක් පිරිවැය ඒකකවලට අය කරන, කාලච්ඡේදයේ ස්ථාවර පිරිවැය සම්පූර්ණයෙන් ම එම කාලච්ඡේදයේ සහභාගයට එරෙහිව කපා හරින ගිණුම්කරණ ශිල්ප ක්‍රමයක් ලෙස ආන්තික පිරිවැයකරණය හැඳින්විය හැකියි.

දායකය/සහභාග ආනත්කිය (Contribution Margin)

විකුණුම් ආදායම හා විචල්‍ය පිරිවැය අතර වෙනස සහභාගය ලෙස හැඳින්වේ. මෙය ඒකකයක් සඳහා හෝ සමස්තය සඳහා ද ගණනය කළ හැකි ය.

(3) ඒකක විකුණුම් මිල රු. 100/-, ඒකකයක විචල්‍ය පිරිවැය රු. 60/-, විකුණුම් ඒකක ගණන 1000
අවශ්‍ය වන්නේ :

(i.) ඒකකයක දායකය
(ii.) සමස්ත දායකය ගණනය කරන්න.

දායක විකණුම් අනුපාතය/ලාභ පරිමා අනුපාතය(Contribution sales Ratio/ Profit volume Ratio)

විකුණුම් ආදායම තුළ දායකය කවර ප්‍රමාණයක් නියෝජනය කරයි ද? යන්න පෙන්වීම දායක විකුණුම් අනුපාතය ලෙස හැඳින්වි. මෙය පහත පරිදි ගණනය කරයි.

$$\text{දායක විකුණුම් අනුපාතය} = \frac{\text{මුළු දායකය}}{\text{මුළු විකුණුම්}} * 100$$

හෝ

$$\text{දායක විකුණුම් අනුපාතය} = \frac{\text{ඒකක දායකය}}{\text{ඒකකයක විකුණුම් මිල}} * 100$$

(4) ඒකක විකුණුම් මිල රු. 100/-, ඒකකයක විචල්‍ය පිරිවැය රු. 60/-, විකුණුම් ඒකක ගණන 1000
අවශ්‍ය වන්නේ :

(i.) **දායක විකණුම් අනුපාතය**

සමච්ඡේදන ලක්ෂ්‍යය (Break- Even Point) / (BEP)

කිසියම් ආයතනයක මුළු ආදායම හා මුළු වියදම සමාන වන ක්‍රියාකාරී මට්ටම, සමච්ඡේදන ලක්ෂ්‍ය ලෙස හැඳින්වේ ... මච්ඡේදන ලක්ෂ්‍යයේ දී ලාභඅලාභ නො...

සමච්ඡේදන ලක්ෂ්‍යය (ඒකක) = ස්ථාවර පිරිවැය / ඒකකයක දායකය

සමච්ඡේදන ලක්ෂ්‍යය (වටිනාකම රුපියල්) = ස්ථාවර පිරිවැය / දායක විකුනුම් අනුපාතය

ආරක්ෂිත ආන්තිකය (Margin of Safety)

ආරක්ෂිත ආන්තිකය යනු අලාභ ඇති නොවී විකුණුම් පහත දැමිය හැකි ප්‍රමාණයයි

ආරක්ෂික ආන්තිකය (ඒකක) = සත්‍ය/ අයවැයගත විකුණුම් ඒකක - සමච්ඡේදන ලක්ෂ්‍යයේ විකුණුම් ඒකක

ආරක්ෂික ආන්තිකය (වටිනාකම රුපියල්) = ශුද්ධ ලාභය / දායක විකුනුම් අනුපාතය

(5) සීමිත විස්කම් සමාගම ඉදිරි මාස තුන සඳහා තම නිෂ්පාදිත A භාණ්ඩය සඳහා පහත පිරිවැය දත්ත ඇස්තමේන්තු කර ඇත.

- ඒකකයක විකුණුම් මිල රු. 100/
- ඒකකයක විචල්‍ය පිරිවැය රු. 50/
- අපේක්ෂිත විකුණුම් ඒකක 500
- ස්ථාවර පිරිවැය රු. 10,000/

අවශ්‍ය වන්නේ :

(i.) ඒකකයක දායකය හා අපේක්ෂිත විකුණුම් මට්ටමේදී සමස්ත දායකය
(ii.) දායක විකුණුම් අනුපාතය
(iii.) සමච්ඡේදන ලක්ෂ්‍ය ඒකකවලින් හා වටිනාකම රුපියල් වලින්
(iv.) ආරක්ෂිත ආන්තිකය ඒකකවලින් හා වටිනාකම රුපියල් වලින්

(v.) අපේක්ෂිත විකුණුම් මට්ටමේ දී ආදායම් ප්‍රකාශය
(vi.) රු. 10,000/-ක ලාභයක් ලැබීමට විකිණිය යුතු ඒකක ප්‍රමාණය
(vii.) ඒකක 100 ක දී ලාභ සමච්ඡේදනය වීමට ඒකකයක මිල කොපමණ විය යුතුද?.

ප්‍රස්තාර මඟින් කරන සමච්ඡේදන ලක්ෂ්‍යය විශ්ලේෂණය

පිරිවැය, පරිමා හා ලාභ විශ්ලේෂණය සමීකරණ ප්‍රවේශයකින් පමණක් නොව ප්‍රස්ථාර ප්‍රවේශයකින් ද දැක්විය හැකි ය. ඒ සඳහා සැලකිලිමත් විය යුතු කරුණු ලෙස,

- අගය නිර්මාණය කිරීම
- පිරිවැය හා ආදායම් රේඛා නිර්මාණය කිරීම දැක්විය හැකි ය.

පිරිවැය, පරිමා, ලාභ විශ්ලේෂණය ප්‍රස්තාර මඟින් ඉදිරිපත් කළ හැක.

(i.) සම්ප්‍රදායික සමච්ඡේදන ප්‍රස්තාරය
(ii.) දායක සමච්ඡේදන ප්‍රස්තාරය
(iii.) ලාභ පරිමා සටහන

සාම්ප්‍රදායික සමච්ඡේදන ප්‍රස්තාරය

මෙහිදී මුළු ආදායම් වක්‍රය, මුළු පිරිවැය වක්‍රය, ස්ථාවර පිරිවැය වක්‍රය ප්‍රස්තාරය තුළ ඇතුළත් විය යුතුයි.



දායක සමච්ඡේදන ප්‍රස්තාරය

මෙහි ඇතුළත් විය යුත්තේ,

- මුළු ආදායම් වක්‍රය
- මුළු පිරිවැය වක්‍රය හා
- මුළු විචල්‍ය පිරිවැය වක්‍රයන් ය



සැ.යු.: සම්ප්‍රදායික සමච්ඡේදන ප්‍රස්ථාරය වැඩි දියුණු කළ අවස්ථාවකි. විචල්‍ය පිරිවැය වක්‍රය ප්‍රස්ථාරය තුළ ඇති බැවින් දායකය හඳුනාගත හැක.

ලාභ පරිමා සටහන (Profit- Volume Charts)

මේ ප්‍රස්තාරයට අවශ්‍ය වන්නේ,

1. සමච්ඡේදන ලක්ෂ්‍යයේ ඒකක ප්‍රමාණය

2. ස්ථාවර පිරිවැයය



සංවේදිතා විශ්ලේෂණය - Sensitivity Analysis

සංවේදිතා විශ්ලේෂණය තුළින් සිදුකරන්නේ ලාභය කෙරෙහි බලපෑමක් ඇති කරනු ලබන විවිධ විචල්‍යයන්හි වෙනස්වීම විශ්ලේෂණය කිරීම යි. එම විචල්‍යයන් පහත සඳහන් වේ.

- විකුණුම් මිල
- විකුණුම් පරිමාව

මෙහිදී එක් විචල්‍යයක වෙනස්වීමක් පමණක් අවධානය යොමුකරන අතර, එහිදී අනෙකුත් සාධක ස්ථාවරයයි උපකල්පනය කෙරේ.

විකුණුම් පරිමාව අඩුවීම

- ✓ ආරක්ෂිත ආන්තිකයේ අඩුවීම
- ✓ ලාභය අඩුවීම
- ✓ සමච්ඡේදනය වෙනස් නොවේ

සමච්ඡේදන ලක්ෂ්‍ය ඒකක වටිනාකම **ලාභය**



(6) පහත වගුව පුරවන්න.

විචල්‍ය	සංවේදීතාවය				
	ඒකක දායකය	මුලු දායකය	සමච්ඡේද ලක්ෂය	ආරක්ෂිත ආන්තිකය	ලාභය
ඒකක මිල ඉහල යාම					
ඒකක මිල පහල යාම					
විකුණුම් පරිමාව ඉහල යාම					
විකුණුම් පරිමාව පහල යාම					

(7) ඒකකයක විකුණුම් මිල රු.200/-ක් වන භාණ්ඩයක වර්තමාන විකුණුම් ඒකක සංඛ්‍යාව 10 000කි. ඒකක 2000ක් නිපදවීමේ දී මුළු පිරිවැය 400 000කි. ඒකක 3000 ක දී මුළු පිරිවැය රු. 550000කි.

අවශ්‍ය වන්නේ,

(1) ඒකකයක විචල්‍ය පිරිවැය ගණනය කරන්න.
(2) ඒකකයක දායකය ගණනය කරන්න.
(3) දායක විකුණුම් අනුපාතය ගණනය කරන්න
(4) සමච්ඡේදන ලක්ෂ්‍ය ඒකකවලින්
(5) ආරක්ෂිත ආන්තිකය (ඒකක)
(6) වර්තමාන විකුණුම් මට්ටමේදී ආදායම් ප්‍රකාශය

(8) මහනුවර පාසලක වාණිජ සංගමය විසින් යාපනයට යෑමට තෙදින අධ්‍යාපන චාරිකාවක් සංවිධානය කෙරේ. සංගමයේ බැංකු ගිණුමේ රු. 20 000 ක ශේෂයක් ඇති අතර, මෙම මුදල චාරිකාවට යොදා ගැනෙන බස්රථ කුලී ගෙවීම සඳහා යෙදවීමට සාමාජිකයෝ එකඟ වූහ.පහත ඇස්තමේන්තු ද ලැබී ඇත.

බස් රථය සඳහා කුළිය	- එක් රථයකට රු.45000 බැගින්(බස් රථයකට සිසුන් 50 බැගින්)
සංචාරක නිවාස සඳහා දින 3 ට කුලී	- සංචාරක නිවාසයකට රු. 20 000 බැගින් (සංචාරක නිවාසයකට සිසුන් 25 බැගින්)
ආහාර වියදම් සඳහා	- සිසුවෙකුට දිනකට රු. 600 බැගින්
වතුර බෝතල් සඳහා වියදම්	- සිසුවෙකුට දිනකට රු. 200 බැගින්
අනෙකුත් වියදම්	- සිසුවෙකුට රු. 600 බැගින්

සිසුන් 100 දෙනෙකු චාරිකාවට සහභාගී වන බව උපකල්පනය කරන්න.

අවශ්‍ය වන්නේ,

(1) සිසුන් 100 දෙනෙකුගෙන් සමච්ඡේද මට්ටම ළඟා වීමට නම්, එක සිසුවෙකුගෙන් අය කළ යුතු මුදල කොපමණ ද?

(2) අතිරික්තයක් තිබේනම්, එම මුදල්, සංචාරය තුළ දී ආගමික ස්ථානවලට පරිත්‍යාග කිරීමට සංගමය බලාපොරොත්තු වේ. එක සිසුවෙකුගෙන් රු. 5 000 ක් අයකරනු ලැබුවේ නම්, පරිත්‍යාග කළ හැකි මුදල කොපමණ ද? **(2012AL)**

(9) රොෂාන් විසින් ඔහුගේ සුඛෝපභෝගී මොටර් රථය යොදා ගනිමින් විවාහ මංගල උත්සව සඳහා රථවාහන කුලියට දීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සැලසුම් කරයි. මෝටර් රථය සඳහා ඇස්තමේන්තු වියදම් පහත පරිදි වේ.

වාර්ෂික රක්‍ෂණය	- රු. 58 000
වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තු	- රු. 8 000
මාසික පිළිසකර කිරීම් සහ නඩත්තු ගාස්තු	- රු. 5 000
වාර්ෂික ක්‍ෂය	- රු. 500 000
රියැදුරුගේ වැටුප	- මසකට රු. 9 00 ක් සහ කුලී ආදායමෙන් 10% කි
පෙට්‍රල් වියදම	- කිලෝමීටරයකට රු. 20 කි.

පහත සඳහන් දෑ ඇස්තමේන්තු කර අත.

වාර්ෂික පරිපාලන වියදම්	- රු. 50 000
මෝටර් රථ කුලී ඇදායම	- කිලෝමීටරයකට රු. 100 කි.

අවශ්‍ය වන්නේ,

(1) ව්‍යාපාරයේ වාර්ෂික පිරිවැය ආවරණය කිරීම ධාවනය කළ යුතු කිලෝමීටර් ගණන

(2) වර්ෂයක් තුළ දී ව්‍යාපාරයට රු 350 000 ක ලාභයක් අපේක්‍ෂා කරන්නේ නම් ධාවනය කළ යුතු කිලෝමීටර් ගණන. **(2013AL)**

(10) තනි හා විශේෂිත අවශ්‍යතා සහිත පාසල් ළමුන්ගේ භාවිතය සඳහා ආනයනික උපාංග එකලස් කිරීමෙන් පරිගණක නිෂ්පාදනය කිරීමට සමාගමක් සැලසුම් කරමින් සිටී. පරිගණකයක විකුණුම් මිල රු. 50 000 ක් ලෙස තීරණය කර ඇති අතර අපේක්ෂිත පිරිවැය පහත පරිදි වේ.

බලපත්‍ර ගාස්තුව	මසකට රු. 50 000
වැටුප්:	
සුපරීක්ෂකවරුන්	මසකට රු. 80 000
එකලස් සේවකයින්	ඒකකයකට රු. 8 000
කුලිය	වසරකට රු. 360 000
රක්ෂණය	මසකට රු. 40 000
ද්‍රව්‍ය පිරිවැය	ඒකකයකට රු.12 000
උපදේශකයන් දෙදෙනෙකු සඳහා ගාස්තුව	මසකට රු.100 000

අවශ්‍ය වන්නේ:

(i) මාසික මුළු ස්ථාවර පිරිවැය (අයිතමන් වෙත වෙන වෙන ම දක්වන්න)
(ii) මුළු පිරිවැය ආවරණය කර ගැනීමට මාසිකව විකිණිය යුතු පරිගණක ගණන.
(iii) රු. 150 000 ක ලාභයක් ඉපැයීම සඳහා මාසිකව විකිණිය යුතු පරිගණක ගණන.
(iv) ඒකක මත වැටුප වෙනුවට එකලස් සේවකයින්ට රු. 80 000 ක මුළු මාසික වැටුපක් ගෙවන්නේ නම්, මුළු පිරිවැය ආවරණය කිරීමට මාසිකව විකිණිය යුතු පරිගණක ගණන. මෙම ස්වයංක්‍රීය කිරීම නිසා වාර්ෂික ස්ථාවර පිරිවැය රු. 180 000 කින් වැඩි වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. **(2017AL)**

(11) පාසලක ගුරුවරුන්ගේ සුභසාධක සංගමයක් එහි සාමාජිකයින් සඳහා සුහද හමුවක් සවිධානය කරමින් සිටී. මෙම සංගමයේ සාමාජිකත්වය දැනට සේවයෙහි නියුතු ගුරුවරුන් 120 කින් සහ විශ්‍රාමික ගුරුවරුන් 30 කින් සමන්විත වේ. මෙම හමුව සඳහා පහත වියදම් ඇස්තමේන්තු කර ඇත.

		රු.
සංග්‍රහ වියදම්	එක් සාමාජිකයකුට	1 100
සමරු කලාපය	එක් සාමාජිකයකුට	225
තෑගි පාර්සලය	එක් සාමාජිකයකුට	775
හෝටල් ගාස්තු		35 000
ශාලා සැරසිලි		5 000
ශබ්ද විකාශන කුලී		2 000
හමුව සංවිධානය කිරීමේ වියදම්		3 000

විශ්‍රාමික ගුරුවරුන් ද ඇතුළුව සහභාගි වන සියලු ගුරුවරුන්ට ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීමට සංගමය බලාපොරොත්තු වේ. ප්‍රවේශ පත්‍රයක් රු. 3 000 කට මිල කර ඇත. අතිරික්ත මුදල් පුණ්‍ය කටයුත්තක් සඳහා යොදවනු ඇත.

අවශ්‍ය වන්නේ, සුහද හමුවට අදාළව පහත දෑ ගණනය කරන්න.

(1) එක් ගුරුවරයකු මත දායකය
(2) මුළු පිරිවැය ආවරණය කිරීමට සහභාගි විය යුතු ගුරුවරු සංඛ්‍යාව.

(3) සියලුම ගුරුවරුන් සහභාගි වන්නේ නම්, පුණ්‍ය කටයුත්ත සඳහා පරිත්‍යාග කළ හැකි මුදල

(4) රු. 27 000 ක් පුණ්‍ය කටයුතු සඳහා පරිත්‍යාග කිරීම පිණිස සහභාගි විය යුතු ගුරුවරු සංඛ්‍යාව.

(5) සියලුම ගුරුවරුන් සහභාගි වන්නේ නම්, ප්‍රවේශ පත්‍රයක් විකිණිය හැකි අවම මිල.

(6) විශ්‍රාමික ගුරුවරුන්ට ප්‍රවේශ මිල දී ගැනීම අවශ්‍ය නොවන්නේ නම් සහ ඔවුන්ගෙන් 24 දෙනෙකු පැමිණීම අපේක්ෂා කරන්නේ නම්, මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා විකිණිය යුතු ප්‍රවේශ පත්‍ර සඛ්‍යාව. **(2016AL)**

(12) පාසලක නාගේන්ද්‍රන් මහතා කොළඹ පෞද්ගලික පාසලක් ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටී. මෙම පාසලේ අපේක්ෂිත ආදායම් සහ පිරිවැය පහත පරිදි වේ.

සිසුවෙකුගෙන් ගාස්තු:

ලියාපදිංචි ගාස්තු	වර්ෂයකට	රු. 12 000
පහසුකම් ගාසතු	වර්ෂයකට	රු. 12 000
පාඨමාලා ගාස්තු	මාසිකව	රු. 10 000

පිරිවැය

පාඨමාලා අත්පොත් මුද්‍රණයට	සිසුවකුට මාසිකව	රු. 4 000
ලිපිද්‍රව්‍ය	සිසුවකුට මාසිකව	රු. 3 000
ක්‍රීඩා වියදම්	සිසුවකුට මාසිකව	රු. 1 000
ගොඩනැගිල්ල සඳහා කුලී	මාසිකව	රු. 40 000
වැටුප්	මාසිකව	රු. 30 000
ප්‍රචාරණ සහ ප්‍රවර්ධන	මාසිකව	රු. 10 000

අවශ්‍ය වන්නේ:

(1) එක් සිසුවකු මත වාර්ෂික දායකය.

(2) පාසලේ වාර්ෂික මුළු ස්ථාවර පිරිවැය

(3) මුළු වාර්ෂික පිරිවැය ආවරණය කිරීම සඳහා බඳවා ගත යුතු සිසුන් ගණන

(4) රු. 240 000 ක ලාභයක් ඉපැයීමට බඳවා ගත යුතු සිසුන් ගණන.

(5) සිසුන් 50 ක් බඳවා ගන්නා අතර ඉන් 10 දෙනෙකුගේ පාඨමාලා ගාස්තු අය නොකරන්නේ නම් අපේක්ෂිත ලාභය හෝ අලාභය. **(2015AL)**

(13) පාසලක් එහි ගුරුවරුන්ගේ වාර්ෂික චාරිකාව සැලසුම් කරමින් සිටී. පාසලෙහි ගිනුම්කරණ ගුරුවරයා විසින් චාරිකාව සඳහා පහත තොරතුරු ඇස්තමේන්තු කර ඇත.

ගුරුවරයෙකුගෙන් අය කරන ගාස්තුව	රු. 1 500
ආසන 40 ක ධාරිතාවයක් සහිත එක් බසයක කුලිය	රු. 40 000
එක් බසයක රියදුරු සහ සහායකට දීමනා	රු. 2 000

එක් ගුරුවරයෙකු සඳහා සංග්‍රහ වියදම්	රු.	?
මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව		100
චාරිකාව සඳහා අපේක්ෂිත උපරිම ගුරුවරු සංඛ්‍යාව		120

අවශ්‍ය වන්නේ :

1) චාරිකාවේ මුළු ස්ථාවර පිරිවැය
2) ගුරුවරයෙකුගේ දායකය
3) ගුරුවරයෙකු සඳහා සංග්‍රහ වියදම්
4) චාරිකාවෙහි ආරක්ෂිත ආන්තිකය (සංඛ්‍යාව සහ රුපියල් වටිනාකම)
5) අපේක්ෂිත උපරිම ගුරුවරු සංඛ්‍යාව සහභාගී වන්නේ නම් චාරිකාවෙන් ලැබෙන අතිරික්තය
6) ගුරුවරුන් 90 ක් පමණක් සහභාගී වන්නේ නම් මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා ගුරුවරයෙකුගෙන් අය කළ යුතු ගාස්තුව **(2019AL)**

(14) මහනුවර පිහිටි අධ්‍යාපන ආයතනයක් ගිණුම්කරණ ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වාදීමට සැලසුම් කරමින් සිටී. එය කුලියට ගත් ස්ථානයක සති අන්තවල පවත්වනු ලබයි. මෙම පාඨමාලාව විෂයන් 10 කින් සමන්විත වන අතර සෑම විෂයක් ම පැය 15 බැගින් උගන්වනු ලබයි. මෙම පාඨමාලාවෙහි කාලය මාස 6 කි. තව ද පාඨමාලාව අවසානයේ දී සෑම සිසුවකු විසින්ම ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ.

ආදායම්

පාඨමාලාගාස්තු	ශිෂ්‍යයෙකුට	රු.	60 000
විභාග ගාස්තු	ශිෂ්‍යයෙකුට	රු.	5 000

වියදම්

කථිකාචාර්යවරුන්ට ගෙවීම :

දේශන ගාස්තු .... පැයකට	රු.	2 000
පැවරුම් ලකුණු කිරීමේ ගාස්තු එක් ශිෂ්‍යයෙකුට එක් විෂයක් සඳහා	රු.	600
ව්‍යාපෘති වාර්තා ඇගයීමේ ගාස්තු එක් වාර්තාවකට	රු.	10 000
අධ්‍යයන ද්‍රව්‍ය පිරිවැය එක් ශිෂ්‍යයෙකුට එක් විෂයක් සඳහා	රු.	500
පාඨමාලා කළමනාකරුගේ වැටුප මසකට	රු.	45 000
ගොඩනැගිලි කුලී මසකට	රු.	40 000
මෙහෙයුම් වියදම . මාස 6 ක කාල සීමාවකට	රු.	70 000
විභාග වියදම් එක් ශිෂ්‍යයෙකුට එක් විෂයක් සඳහා	රු.	400

අවශ්‍ය වන්නේ :

(1) ශිෂ්‍යයෙකුගේ දායකය
(2) පාඨමාලාවේ මුළු ස්ථාවර පිරිවැය
(3) පාඨමාලාවේ මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා බඳවාගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව
(4) රු. 200 000 ක ලාභයක් ඉපැයීමට පාඨමාලාවට බඳවාගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව
(5) අපේක්ෂිත ලාභය සහ බඳවාගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙළින් රු. 350 000 ක් සහ 30 ක් නම්, එක් ශිෂ්‍යයෙකුගෙන් අය කළ යුතු අවම පාඨමාලා ගාස්තුව **(2018AL)**